# තරුණ වියඃ අභිමානය අභියෝග හා අභිවෘද්ධිය

තරුණ වියෙහි ජීවත්වන පිරිමින් හැඳින්වීම සඳහා **තරුණයා, ගැටයා, ගැටවරයා යෞවනයා, මානවකයා, කොල්ලා** යනාදි ව්‍යවහාර ද, ගැහැණුන් හැඳන්වීම සඳහා **තරුණිය, යෞවනිය, මානවිකාව, ගැටිස්සිය, කෙල්ල** යනාදි නම් ද වහරනු ලැබේ. මෙම සියලු පර්යාය පදවල අර්ථමය වශයෙන් ඔවුන්ගේ ගති ලක්‍ෂණ සමඟ කිසියම් සම්බන්‍ධයක් දක්නට ලැබේ. යොවුන් පුද්ගලයන් තුළ පවතින ගුණාංග අතර සුවිශේෂී ලක්‍ෂණය වන්නේ කායික ජව සම්පන්න්භාවයයි (**ජවො**). එහෙත් මීට වඩා බොහෝ ලක්‍ෂණ තරුණ පුද්ගලයන් තුළ දක්නා ලැබේ. පෙනුම (**රූපවා**), නව්‍ය බව (**යොබ්බඤ්ඤං**), ධෛර්ය සම්පන්න බව (**ධිතිමා**), ක්‍රියාශීලිත්වය හා කාර්යශූරත්වය (**සූරො**) මෙම වයසේ සිටින පුද්ගලයෙකුට උපරිමයෙන් හිමිවේ. මෙම නිසා ලෝකයෙහි කවදත් තරුණයන් සහ තරුණියන් විෂයෙහි විවිධ ක්‍ෂෙත්‍රවල වැඩි ඉල්ලුමක් පවතී. ස්වකීය ගෘහයෙහි දී පමණක් නොව විවාහය, අධ්‍යාපනය, රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි ද, ආගමික හා සංස්කෘතික ක්‍ෂෙත්‍රයන්හි ද තරුණයන් විෂයෙහි දක්වන ඉල්ලුම ප්‍රබල වේ. ඔවුන්ගේ ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය තියුණු වීම මෙයට හේතුවයි. එහෙයින්ම තරුණ විය ඉක්මයාම මානසික කනස්සල්ලකට හේතුවන බැවින් වයස්ගත පුද්ගලයෝ ද තරුණ පෙනුම ආරක්‍ෂා කර ගැනීමට විවිධ උත්සාහයන් දැරීම සමාජයේ සුලබව දක්නට ලැබෙන කරුණකි. එයින් ඇඟවෙන්නේ භෞතිකත්වයට වටිනාකම් ලබාදෙන ජීවන රටාවක් නිර්මාණය වන විට වයස් සීමාවන් මනුෂ්‍යත්වයේ වටිනාකම ද තීරණය කරන බවයි. මේ නිසා තරුණයෙකු හෝ තරුණියක හෝ තම යෞවන විය සහ එහි වටිනාකම පිළිබඳ ගැඹුරු අවබෝධයකින් යුතුව සිටීම අතිශය ප්‍රයෝජනවත් වේ.

## තරුණ විය

තරුණ විය යනු ළමා සහ වැඩිහිටි කාලය අතරතුර කාල සීමාවයි. මෙම කාල සීමාව සම්බන්‍ධයෙන් විවිධ මත පවතී. **යුනෙස්කෝ සංවිධානය** පිළිගත් පරිදි වයස අවුරුදු 15 - 24 කාලය අතර ජීවත්වන පුද්ගලයා අයත් වන්නේ තරුණ වියට ය.[1] තරුණ ප්‍රජාව නව්‍යකරණය උදෙසා අදහස් මතුවන උල්පත බවත් ඔවුන් අද දවසේ චින්තකයන් බවත් අර්බුද විසඳන්නන් බවත් සාමයෝ උත්ප්‍රේරකයන් බවත් පිළිගන්නා යුනෙස්කො සංවිධානය තරුණ විය සම්බන්‍ධයෙන් විමසන විට ඔවුන්ට හිමි වයස් සීමාවක් ඇතත් සැබැවින්ම ඵලදායක වන්නේ ඔහුගේ හෝ ඇයගේ වයස් සීමාවම නොවේ. ඇතැමුන්ගේ නිර්වචන අනුව යොවුන් විය යන්නෙන් සැලකෙනුයේ වයස අවුරුදු 18 සිට 24 දක්වා කාලයයි. තවත් සමහරු 20 සිට 40 දක්වා කාලය තරුණ විය ලෙස සලකති. එහෙත් වැදගත් කාරණය වන්නේ ඔහුගේ හෝ ඇයගේ කායික මානසික සෞඛ්‍යය බව

සිතීම වඩාත් යෝග්‍ය වේ. කුමක් නිසාද යත් තරුණ වියෙහි සිටින ඇතැම් අය මහල්ලන් මෙන් අක්‍රිය තත්ත්වයෙන් ද තරුණ විය ඉක්මගිය, මුහුකුරාගිය වයසෙහි සිටින ඇතැම් අය තරුණයන් මෙන් ජවසම්පන්නව, සමහරවිට ස්වකීය බුද්ධිමය හා ශ්‍රමික දායකත්වය මනුෂ්‍ය වර්ගයාගේ යහපත් සඳහා කැපකරවන හෙයිනි. තරුණ විය රටක් වෙනුවෙන් ඵලදායක මෙහෙවරක් කළ හැකි වටිනා කාලයක් වුවද ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල තරුණ ප්‍රජාව පිළිබඳ මෙතෙක් විධිමත් ප්‍රතිපත්ති හෝ ප්‍රඥප්ති හෝ සැකසී නැත. එසේම තරුණ ප්‍රජාව මුහුණපාන දැවෙන අභියෝග හා ගැටලු පිළිබඳ අවධානයක් යොමු වී ද නැත.

තරුණ විය හඳුනා ගැනීමෙහි දී වඩාත් සිත්ගන්නා සුලු අදහසක් බුද්ධඝෝෂ හිමියන් විසින් විසුද්ධිමග්ගයේ **ජීවිතදසක** යටතේ දක්වා ඇත.[2] ඒ අනුව කෙනෙකු ජීවත්විය හැකි උපරිම කාලසීමාව වර්ෂ 100 ක් ලෙස උපකල්පනය කෙරේ. එම වර්ෂ සියය වර්ෂ දහය බැගින් වන දසක දහයකට බෙදා දක්වා ඇත.

**මන්දදසක** (අවු 01-10 අතර කාලය) බොළඳ ළමයෙකු ලෙස ක්‍රියා කරයි.

**ඛිඩ්ඩාදසක** (අවු 10-20 අතර කාලය) ක්‍රීඩාශීලී ළමයෙකි.

**වණ්ණදසක** (අවු 20-30 අතර කාලය) කායික වර්ණය කෙරේ සැලකිලිමත් වෙයි.

**බලදසක** (අවු 30-40 අතර කාලය) ශක්තිමත් වෙයි.

**පඤ්ඤාදසක** (අවු 40-50 අතර කාලය) ප්‍රඥාවෙන් යුතුව ක්‍රියා කරයි.

**හානිදසක** (අවු 50-60 අතර කාලය) කායික පරිහානිය ආරම්භ වෙයි.

**පබ්භාරදසක** (අවු 60-70 අතර කාලය) කය ඉදිරියට නැමෙයි.

**පවඞ්කදසක** (අවු 70-80 අතර කාලය) වකුටු වෙයි.

**මොමූහදසක** (අවු 80-90 අතර කාලය) සිහි කල්පනාව අඩුවේ.

**සයනදසක** (අවු 90-100 අතර කාලය) වැඩි වශයෙන් ශයනයෙහි වෙසේ.

ඉහත විග්‍රහය අනුව මිනිසෙකුගේ කායික හානිය ආරම්භ වන්නේ වර්ෂ 50ක් ගත වූ පසුවය. වර්තමානය වන විට පරමායුෂ වර්ෂ සියයක් ලෙස නො සැලකෙන හෙයින් එය වර්ෂ 40කින් පසුව සිදුවේයැයි සැලකුව ද වරදක් නැත. බෞද්ධ සාහිත්‍යාගත සාධක අනුව වර්ෂ 16 සිට 35 තරම්වන කාලය භද්‍ර යෞවනය ලෙස සැලකිය හැකිය. සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේගේ අභිනිෂ්ක්‍රමණ 29 වන වියේ දී සිදුවීමත් මෙම වයස භද්‍ර යෞවනය ලෙස සලකා තිබීමත් මෙයට සාධකයකි.[3] එතැන් සිට මුහුකුරා ගිය කෙනෙකු වශයෙන් සැලකේ. වයස මුහුකුරා ගිය තැනැත්තෝ බොහෝ විට ජීවිත අත්දැකීම් සහිතව සංයමය උපදවා ගනිති. එහෙත් තරුණයෝ එසේ නො වෙති. ඔවුන්ගේ බුද්ධියට වඩා හදවත සක්‍රීය වේ. බුද්ධියෙන් සිතාමතා තීරණ ගත යුතු වුවත් ඔවුන් හදවතට දැනෙන දේ අනුව තීන්දු තීරණ ගැනීමට ඔවුහු රුචි කරති. යමෙකුට වයස

අවුරුදු 18 දී විප්ලවීය අදහස් පහළ නොවුණොත් ඔහුට හදවතක් නැත. එසේම යමෙකුට වයස අවුරුදු 40 දී විප්ලවීය අදහස් පහළ වේ නම් ඔහුට බුද්ධියක් නැතැයි වරක් **බර්නාඩ් ෂෝ** පැවසූයේ මේ නිසා විය යුතුය. මෙම නිසා බුද්ධියෙන් තීරණ ගැනීම සඳහා තරුණයින්ට උපදෙස් සැපයීමට වැඩිහිටියෝ උත්සුක වෙති. එබැවින් තරුණ විය ජීවිත කාලය තුළ පුද්ගලයෙකු ලබන ජවසම්පන්නම කාලය වුවත් කායික මානසික සංයමයක් මෙම කාලය තුළ තිබීම වැදගත් වේ.

## තාරුණ්‍යයේ වටිනාකම

සැබැවින්ම ලෝකයෙහි වඩාත් ආකර්ෂණීය වන්නේත් වැඩිම ඉල්ලුමක් පවතින්නේත් තරුණයන් විෂයෙහිය. භාර්යාවක් තෝරා ගැනීමෙන් වඩාත් උසස් වන්නේ තරුණ බිරිඳක් තෝරා ගැනීම බවට එක්තරා දෙවියෙකු විසින් බුදුරදුන් ඉදිරියේ කරන ලද ප්‍රකාශයක් සංයුත්තනිකායේ ඛත්තිය සූත්‍රයේ සඳහන් වේ (කොමාරි සෙට්ඨා භරියානං)[4] විශේෂයෙන් යොවුන් පුද්ගලයන් තුළ පවතින උසස් ගුණාංග හා හැකියාවන් කෙරෙහිය. තරුණ ප්‍රජාව අඳින පලඳින, සිතන පතන හා කරන කියන දේ සමාජයේ විශේෂ අවධානයට පාත්‍ර වන අතර, ඔවුන්ගේ රුචිකත්වයන් හා ක්‍රියාකාරකම් විෂයෙහි ඇගයීම් සිදු කෙරේ. නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි ඇඳුම් පැළඳුම්, ගේදොර, යානවාහන ආදියේ විවිධ විලාසිතා වෙළඳපොළ ආක්‍රමණය කරනුයේ තාරුණ්‍යයේ රුචිකත්වය හා චින්තන ශක්තියේ මහිමය නිසාය. එසේම විලාසිතා සහිත ලෝකය මොහොතින් මොහොත නවීකරණය වන්නේ තරුණ ප්‍රජාව ඉලක්ක කර ගෙනය. එහෙයින්ම ලෝකයේ සියලු දේ සජීවී, අත්‍යවශ්‍ය හා වැදගත් දේ බවට පත් කෙරේ. මේ නිසා එක් අතකින් ලෝකය යනු කායික මානසික සෞඛ්‍යයෙන් යුතු තරුණ ප්‍රජාවගේ උරුමයකි. මෙකී අවධිය පිළිබඳව කෙරෙන විමසීමක දී වඩාත් වැදගත් වන්නේ ඔහු හෝ ඇය හෝ ගෙවන කාල පරාසයටත් වඩා ඔවුන් තුළ පවතින කායික මානසික තත්ත්වයන් හා රුචිකත්වයන් කෙරෙහිය. නව ක්‍රියාකාරකම් විෂයෙහි ඔහු හෝ ඇය තුළ පවතින උද්‍යෝගය කෙරෙහිය. මහල්ලන් යනු සමාජයට තම කායික මානසික ශක්තීන් කැප කර දැනට විශ්‍රාමිකව ඉන්නා පිරිසක්ය යනු සමාජයේ පොදු පිළිගැනීමයි. එයින් අවධාරණය වන්නේ රටක ජාතියක දියුණුව උදෙසා කැපවිය යුතු පිරිස තරුණ ස්ත්‍රී පුරුෂයන් බවයි.

ථේරවාද බෞද්ධ මූලාශ්‍රයන්හි සුපුෂ්පිත යෞවනත්වයක් ගොඩනැගීමට අවශ්‍ය කරුණු ගොඩගැසී ඇතත් අවාසනාවකට තවමත් ඒවා බොහොමයක් සැඟවී ඇත. බුදුන් වහන්සේ ආගමික ශාස්තෘවරයෙකු වශයෙන් පමණක් නොව සමාජ විශ්ලේෂකයෙකු හා මනෝවිද්‍යාඥයෙකු වශයෙන් ද තාරුණ්‍යයේ ප්‍රභූත්වය ශක්තිය අපේක්ෂා හැඟීම් ආවේග යනාදිය කෙරේ දැඩි අවධානය යොමු කොට ඇත. චින්තන විප්ලවයකට තුඩුදුන් බුදුදහම භාරතය තුළ ස්ථාවර කිරීමට එකතු කරගත් පුද්ගලයන්ගෙන් වැඩි ප්‍රමාණයක් තරුණයන් හා තරුණියන් බව ඓතිහාසික

මූලාශ්‍රයන්ගෙන් අනාවරණය වේ. ප්‍රථම භික්ෂූන් හැට නම අතර දෙතුන් දෙනෙකු හැරුණු විට අනෙක් සියල්ලෝම නිසැක වශයෙන්ම තරුණයෝය. යසකුල පුත්‍රයා සහ ඔහුගේ මිත්‍රයන් පණස් එක් දෙනෙකු එක්වර සසුනට ඇතුළත් වූහ.[5] බුදුරදුන් කෙරෙහි පැහැදුණු තුන්බෑ ජටිලයන් ඇතුළු පිරිස එක්දහස් දෙසිය පණහක් වේ.[6]

බුදුදහම ව්‍යාප්ත කිරීම සඳහා මෙම යොවුන් ප්‍රජාව දුන් දායකත්වය අප්‍රමාණ වේ. ක්‍රි. පූ. 6 සියවස ආගමික ක්ෂෙත්‍රය තුළ නව හැරවුම්කරුවෙකු ලෙස අන්‍යාගමික නායකයින්ගේ ද අවධානයට බුදුන් වහන්සේ යොමුවීමට කරුණු රාශියක් බලපෑ අතර උන්වහන්සේ තුළ පැවති යොවුන් බව ද ප්‍රධාන කරුණකි.[7] බ්‍රාහ්මණ ආගමික නායකයෙකු වන කූටදන්ත විශාල අනුගාමිකයන් පිරිසකගේ විරෝධතාව ද නොසලකා බුදුන් වහන්සේ බැහැදැකීමට යාම සඳහා තීරණය කරන ලද්දේ තරුණ ආගමික නායකයෙකු වීම ද සැලකිල්ලට ගැනීමෙනි. ශ්‍රී ලංකාවේ දැවැන්ත සංස්කෘතික ප්‍රතිසංස්කරණයක් සිදුකළ මහා මහින්ද හිමියන් සියලු ක්‍රියාදාමයන් සිදු කළේ භද්‍රයෞවනයේ දී බව අපි දනිමු. රාජ්‍යයන් විශාල සංඛ්‍යාවක් ආක්‍රමණය කරමින් සිය නාමය ස්ථාපිත කළ **මහා අලෙක්සැන්ඩර්** අධිරාජ්‍යයාගේ ජීවිත කාලය වයස අවුරුදු තිස් දෙකකින් නිමාවට පත්විය.[8] එබැවින් තාරුණ්‍යය නිකරුණේ මලානික වීමට ඉඩ දීම දුර්වල මිනිසෙකුගේ ලක්ෂණයක් බව පෙනේ.

## තරුණයා සහ බාලයා

පාලි සූත්‍රවල සුසු, තරුණ, යුවා, යොබ්බන, බාල, කුමාර, දහර යනාදි නම් තරුණයන් හැඳින්වීම සඳහා යෙදේ. බාල යන පදය ද මීට සමගාමීව යන තවත් පදයකි. එහි ප්‍රධාන අරුත් දෙකක් ඇත. ඉන් එකක් වන්නේ කුඩා ළමයා යන්නයි. අනෙක අඥානයා, බුද්ධියෙන් අඩු තැනැත්තා, සිතීමේ විමසීමේ ශක්‍යතාවෙන් හීන තැනැත්තා හෝ ගුණාත්මක බවින් අඩු තැනැත්තා යන්නයි. මෙහි ප්‍රතිවිරුද්ධ පදය වන්නේ පණ්ඩිත යන්නයි. බාල යන පදයෙහි අර්ථය සංකීර්ණ වන්නාක් මෙන්ම පණ්ඩිත යන්නෙහි අරුත ද සංකීර්ණය. බුද්ධියෙන් වැඩි, ආධ්‍යාත්මික වශයෙන් පිරිපුන්, උගත්, ශික්ෂිත යනාර්ථ එහි ඇත.[9] පණ්ඩිත නමින් ගැනෙන පුද්ගලයා ජීවිතය හසුරුවා ගන්නා අයුරු දනී. එසේම ඔහු සමාජ ප්‍රගමනය හා එහි සුවදායී පැවැත්ම වෙනුවෙන් කැපවී ක්‍රියා කරයි. ඔහුගේ හෝ ඇයගේ කායික වාචසික මානසික සියලු ක්‍රියාදාමයන් යහපත් වන බව අංගුත්තරනිකායේ තිකනිපාතයෙහි දැක්වේ.[10] මෙසේ නො කරන තරුණයෙක් වේ නම් ඔහු බාලයෙක් හෙවත් අඥානයෙක් වේ. සමහර තරුණයෝ මසින් ලෙයින් මහත් වුවත් දැනුමෙන් ඉතා කෘශ වූවෝ වෙති.[11] එබඳු සමහර තරුණයෝ කිසිවක් දන්නේ නැත. එහෙත් දන්නා අය ලෙස පෙනී සිටිති. යමක් දන්නා අයට උපහාස ද කරති. එසේම කර්මය කර්ම ඵල බුදුන් දහම් සඟුන්

දෙවියන් භූතයන් ආදී කිසිවක් ගැන නො දනිති. විශ්වාස නො කරති. එතකුදු වුවත් දන්නා හා විශ්වාස කරන්නන් පිරිහෙළා කථාකරති. මෙය ලෝකයේ පවතින අතිශය ඛේදජනක තත්ත්වයක් වේ.

## යොබ්බන මදය

මිනිසුන්ට ඇති වන මද රාශියක් පිළිබඳව පාලි සූත්‍රාන්ත දේශනාවල සඳහන් වේ. **ජාතිමදය, ගෝත්‍රමදය, අරෝග්‍යමදය, ජීවිතමදය, ලාභමදය, සත්කාරමදය, ඍද්ධිමදය, ශිල්පමදය, ආරෝහ පරිණාහමදය, යශස්මදය, රූපමදය** ආදී අනේකවිධ මද අතර **යොබ්බනමදය** ද එකකි.[12] තරුණ වියෙහි සිටින සෑම පුදගලයෙකුටම ඇති වන පදනම් විරහිත මානසික තත්ත්වයක් ලෙස බුදුදහම යෞවනමදය (යොබ්බනමද) හඳුනාගනී. (අත්ථි භික්ඛවේ සත්තානං යොබ්බනෙ යොබ්බනමදො)[13]. මෙම වයසේ දී සාමාන්‍ය වශයෙන් සෑම පුද්ගලයෙකුම හිතුවක්කාර නැතහොත් දඟකාර වේ. ඇතැම් අය තුළ කායික සංයමක් සහිත හිතුවක්කාරකම් ද ඇතැම් අය තුළ කායික සංයමයක් රහිත හිතුවක්කාරකම් ද පවතී. කෙසේ වුවත් මෙම මානසික වියරුවෙන් සිටින අය අඩුවැඩි වශයෙන් කායික වාචසික මානසික දුශ්චරිතවලට පෙලඹෙති[14]. මම තවම තරුණය, එහෙයින් පින් කිරීම අවශ්‍ය නැත, ඊට තවම කල් ඇත යනුවෙන් ඇතැම් අය සිතනුයේ මෙම මදය හෙවත් තරුණ බවින් මත්වීම නිසාය. මත් වූ හස්තියෙකු විලංගු දැමීමෙන් වුවද වලංගු නොවන්නාක් මෙන් මෙම තරුණයෝ ද වලංගු නොවෙති. තමන් සියල්ල දන්නාක් මෙන් මෙකල ඔවුහු උපකල්පනය කරති. වැඩිහිටියන්, ශ්‍රමණ බ්‍රාහ්මණයන් දක්වන ඔවදන්, උපදේශ ඔවුහු පිළිගැනීමට රුචියක් නො දක්වති. මෙබඳු තරුණයන් දතයුතු වටිනාම දෙය නම් සියල්ල දැනගැනීමට තරම් තවමත් ඔවුන් තරුණ නොවන බවයි.

නූතන අධ්‍යාපනයේ දී යොවුන් ප්‍රජාවට බොහෝවිට උගන්වනු ලබන දෙය නිසරු ය. එහි මලක් නෙළා ගැනීමට උගන්වනු මිස පැළයක් වගා කොට තමන්ගේම පැළයකින් මලක් නෙළා ගැනීමට නූගන්වයි. පොදු සම්මතය අනුව තරුණ වියේ දී කෙනෙකුට යමක් ඉගෙනගත හැකි ය. එහෙත් ඒ පිළිබඳ අවබෝධයක් ඇති වන්නේ මහලු වියට පත් වූ කල්හි ය. තරුණ වියෙහි සිටින අය බුදුදහමෙහි උගන්වන යොබ්බන මදය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම අතිශය ප්‍රයෝජනවත් වේ. මද යන්නෙහි සැබෑ අරුත නම් අවිඥානක බව යන්නයි. සිහි කල්පනාවක් නැතිව ක්‍රියා කරන බව යන්නයි. උමතු බව හෙවත් මනස අවුල් වූ යන්නයි. **මද** යන පාලි වචනයේ ධාතුව **මද්** යන්නයි. ඉංග්‍රීසි අකුරෙන් මෙය ලියන්නේ Mad යනුවෙනි. **මැඩ්** යනුවෙන් උසුරුවනු ලබන එහි තේරුම **ප්‍රමත්ත, උමතු, උන්මත්තක, කුපිත, පිස්සු** යනාර්ථ ශබ්දකෝෂවල සපයා නැත.[15] එබැවින් යොබ්බන මදයෙන් යුතු පුද්ගලයන් එය තමා සතු යහපත් චරිත ලක්ෂණයක් නොවන බව තේරුම් ගත යුතුය.

ආගමෙන් ධර්මයෙන් පලක් නැත. සාම්ප්‍රදායික ඥානයෙන් වගතුවක් නැත. ආචාරධර්ම නිසරු දේය. වැඩිහිටියන් යල් පැනගිය අදහස් ඇත්තෝය. අල්ලස් ගැනීම කූටක්‍රම අනුගමනය කිරීමෙන් වුව මුදල් ඉපයීම කළ යුතුය. අන්‍යයන් විපතට පත් කිරීම, අක්‍රමිකතා මගින් දියුණුවීම, ලිංගික පහස උදෙසා ආගමික සමාජ නීති උල්ලංඝනය කිරීම, අසත්‍යයෙන් සත්‍යය යටපත් කිරීම, දුම්වැටි මත්පැන් ආදියෙන් පෞරුෂයත්වය සොයායාම වැනි මානසික තත්ත්වයන් ඇති තරුණයෝ අප සමාජයේ බහුලව වෙසෙති. ශිෂ්ට සම්පන්න ලෝකයේ මොවුන් සැලකෙනුයේ සමාජ දූෂකයන් වශයෙනි. භෞතිකත්වය විෂයෙහි විශේෂ ඇගයීම් සැපයෙන ආර්ථික දේශපාලනික ආගමික හා සමාජික පසුබිම් සහිත ලෝකයක එබඳු සමාජ දූෂකයන් බහුල වන අතර එයින් සමස්ත සමාජය පුරා පැතිර යන පිළිලයක් සැකසෙන අයුරු දීඝනිකායේ චක්කවත්තිසීහනාද සූත්‍රය ඇසුරෙන් තහවුරු වෙයි.

## අපේක්ෂාභංගත්වය, ආවේග හා ආවේග පාලනය

සෑම මිනිසෙකු තුළම විවිධ අපේක්ෂා පවතී. දැනුම් තේරුම් ඇති වියට පැමිණීමත් සමඟ ඒවා ඉටු කර ගැනීම උදෙසා ඔවුහු සැලසුම් සකසති. ඇතැම්හු සැලසුමට අනුව උත්සාහ කරති. ඇතැම්හු ප්‍රාර්ථනා කරති. එහිදී කිසිවක් සියයට සියයක්ම සාර්ථක නොවන අතර අනවබෝධය නිසා ඔවුහු ආවේගකාරීව ක්‍රියාකිරීමට පෙලඹෙති. ආවේග පාලනය පිළිබඳ අවබෝධය වැදගත් වන්නේ එවිටය. අපේක්ෂා භංගත්වය නිසා ඇතිවන ආවේග පාලනය කරගත නොහැකි වූ කල්හි විපත් සිදු කරගැනීම හෝ අනුන්ට විපත් සිදුකරවීම පිළියම නොවේ. සියදිවි හානිකර ගැනීම, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, කලකිරීමෙන් ජීවත්වීම,[16] අනුන් සතු දේ අයුතු ලෙස ලබා ගැනීමට වෑයම් කිරීම, ස්ත්‍රී දූෂණ, මංකොල්ලකෑම් වැනි අපරාධවලට යොමුවීම බුද්ධිහීනත්වයේ ප්‍රතිඵල වේ. සැබැවින්ම තරුණයෙකු නම් වෙනස් ලෙස සිතන්නෙකු විය යුතුය. අලුත් නිර්මාණ විෂයෙහි උද්‍යොගයක් තිබිය යුතුය. වෙනත් විධියකින් කිවහොත් විවර නොවූ මග විවෘත කරන්නෙකු විය යුතුය. බුදුදහම අලෞකිකත්වය අගයන දහමක් වුවද තරුණ වියේ දී ගිහියෙකු වශයෙන් කෙළි සෙල්ලම් කිරීම, විනෝදවීම, ආදරය කිරීම, විවාහවීම, දරුවන් බිහිකිරීම, වෘත්තීය කටයුතුවල යෙදීම, ධනය ඉපයීම යනාදි ලෞකික වින්දනයන් පහත් ක්‍රියාවන් ලෙස පරිභවයට ලක්කොට නැත. තරුණ වියෙහි දී ලෞකික දියුණුව සලසා ගැනීම අවශ්‍යතාවක් ලෙස බුදුදහම පිළිගනී. එහිලා පසුගාමී වීම පශ්චාත්තාපයට කරුණක් ලෙස ද බුදුදහම දක්වා ඇත.

'යමෙක් තරුණ වියේ දී බඹසරත් නොහැසිරේ නම් ධනයත් නූපදවයි නම්
ඔහු වයස්ගත වූ කල මසුන් නැති විලක් සමීපයෙහි තැවෙන කොස්වා
ළිහිණියෙකු මෙන් කල්පනා කරමින් සිටී'[17]

තරුණයෙකුට තම ජීවිතයේ අභිවෘද්ධිය සාධා ගැනීමට ඉවහල් වන කරුණු හතක් බුදුන් වහන්සේ සංයුත්තනිකායෙහි දේශනා කොට ඇත. එනම් 1 කල්‍යාණමිත්තතා හෙවත් යහපත් මිත්‍රයන්ගේ ආශ්‍රය 2. සීලසම්පදා හෙවත් ගුණගරුක වීම 3. ඡන්දසම්පදා හෙවත් කුසල් කිරීමට කැමති කෙනෙකුවීම 4. අත්තසම්පදා හෙවත් මනා චිත්ත ශක්තියක් තිබීම 5. දිට්ඨිසම්පදා හෙවත් ඥාන සම්පන්නවීම 6. අප්පමාදසම්පදා කළයුතු දේ පිළිබඳ නිරන්තර අවදියෙන් සිටීම 7. යොනිසො මනසිකාර සම්පදා හෙවත් උපාය ඥානයෙන් යුක්තවීම යනුවෙනි.[18] එසේම අවේලාවෙහි වීථිසංචාරය, නාට්‍ය සංගීත සන්දර්ශන පසුපස හඹා යාම, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, පාපී මිත්‍රයන් ඇසුර, ස්ත්‍රී ධූර්ත වීම යනාදි කරුණ රාශියක් පිරිහීමට තුඩු දෙන බව සිගාලෝවාද, පරාභව වැනි සූත්‍ර දේශනාවල දක්වා ඇත.

තරුණ වියේ බොහෝ අයගේ දහම නම් ස්වාභිමතයට අනුව දිවි පැවැත්මයි. තවද ඔවුන් උපකල්පනය කරනුයේ ධාර්මික ජීවිතය මහලුවියේ දී ප්‍රායෝගිකව අත්විඳිය යුත්තක් බවයි. මෙය සපුරා වැරදි උපකල්පනයකි. මෙම චින්තනය වර්තමානයට පමණක් පොදු වූවක් නොවේ. අතීතයේ ද මෙසේමය. මෙය මිනිසුන්ට පමණක් නොව දෙවියන් වැනි සත්ත්ව විශේෂයන්ට ද පොදු දැක්මක් වූ බවට සාධක පෙළෙහි විද්‍යමාන වේ. වරක් එක් දෙවඟනක් තරුණ භික්ෂුවක් වෙත පැමිණ කළ ප්‍රකාශයක් සංයුත්තනිකායේ මෙසේ ඇතුළත් වේ. "ශ්‍රමණය ඔබ පැවිද්දෙකි. තරුණය. කළු කෙස් ඇත්තේය. භද්‍ර යෞවනයේ සිටින කෙනෙකි. ප්‍රථම වයසෙහි සිටිහි. කම් සුව නොවිඳි කෙනෙකි. එහෙයින් මානුෂික වූ කම්සැප විඳින්න. පෙනෙන දේ අතහැර නොපෙනෙන දෙයක් පසුපස නොයන්න."[19] තරුණකම හුදෙක් රාගයට නිවාසයක් බවත් එහිදී කළයුතු නොකළයුතු දේ පිළිබඳ උදාසීන වීම මිහිපිට කවරෙකුට වුවත් සිදුවිය හැක්කක් බවත් එසේ ඉන්ද්‍රිය වශගවීම ගර්හා කළයුතු බව සියලු දෙනා වුවත් දෙමාපියන්ට උවටැන් කිරීමට එය බාධාවක් නොවන බව ද පෙරදිග චින්තකයන්ගේ අදහසකි.[20]

මිනිසෙකුගේ වයස අනුව සිදුවන විපර්සාසයන් රාශියක් වේ. ගස්වැල් ආදි අචේතනික වස්තූන්ගේ පවා වෙනස්වීම වීම පරිණාමයේ ලක්ෂණයක් වුවත් එය යහපත් අයහපත් ගුණාංග දෙකම භජනය කළ හැකිය. එබැවින් සචේතනික සත්ත්වයෝ අචේතනික වස්තූන් මුහුකුරා යාමේ දී අයහපත් අංග ඉවත් කරමින් යහපත් අංග ආරක්ෂා කරති. නිදසුනක් වශයෙන් කෘෂිකර්මාන්යෙහි නියුතු ගොවියෝ ශස්‍යවලට හානිවන වල්පැළෑටි ආදිය උගුලා දමති. කෘමිනාශක යොදා කෘමීන්ගෙන් ආරක්ෂා කරති. එමෙන් වැඩිහිටියෝ ද යම් යම් අවස්ථාවල දී දරුවන් තුළ දක්නට ලැබෙන පහත් පුරුදු ගතිගුණ ක්‍රියාකාරක්ම නිර්දය ලෙස විවේචනය කරමින් ඔවදන් දෙමින් ඔවුන් විපතින් වළකා යහපතෙහි යොදවති. (පාපා නිවාරෙන්ති)[21] යොවුන් බව, ධනවත්කම, ප්‍රභුත්වය, අවිවේකී බව යන මෙකී කරුණු එකිනෙක වියුක්තව සැලකුව ද මිනිසාගේ අනර්ථය විෂයෙහි

ඉවහල් වන බවත් මෙම කරුණු හතරම එක් පුද්ගලයෙකු කෙරෙහි පිහිටි කල්හි කියනුම කවරේදැයි පෙරදිග පඬිවරයෙකු කළ ප්‍රකාශය ඉතා ප්‍රකටය.[22] මෙම නිසා තරුණයන් අපේක්ෂා කරන ධනය බලය හා කාර්යබහුල ජීවිතය පිළිබඳ විවේක බුද්ධියෙන් යුතුව සිතිය යුතුව ඇත. ලංකා ඉතිහාසයෙහි ශ්‍රේෂ්ඨ චරිතයක් වන සිරිසඟබෝ කුමරුට ශිල්ප ශාස්ත්‍ර උගන්වා වියතෙකු කොට රාජ්‍යය බාර ගැනීමෙහි ලා සුදුස්සෙකු බවට පත්කළ නන්ද හිමියන් ඔහු සමාජගත කිරීමට පෙර දුන් උපදේශය ද මෙහි ලා සඳහන් කිරීම සුදුසුය.

> *"පිනැති කුමරුනි, ඔබ දූන් උගතෙකි. බාහිර ශිල්ප ශාස්ත්‍ර සියල්ල දන්නෙකි. චතුර්විධ පාණ්ඩිත්‍යයෙහි කෙළ පැමිණියෙකි. එසේම අභිමානයම ධනය කොට ඇති ක්ෂත්‍රිය වංශයෙහි උපන්නෙකි. සියලු තැන්හි පැතිර ගිය යෞවන විලාසයෙන් සමලංකෘත සිරුරු ඇත්තෙකි. අප්‍රතිම වූ රූපශ්‍රී ඇත්තෙකි. අමානුෂික වූ ශක්තිය ද ඇත්තෙකි. ඒකාන්තයෙන් මේ සියල්ල අනර්ථ පරම්පරාවෙකි. ඒ අතරින් එකිනෙක නො හික්මීමට උත්පත්තිස්ථාන වේ. සියල්ලම එකතු වූ කල්හි කියනුම කවරේද? බෙහෙවින්ම ශාස්ත්‍ර නමැති ජලයෙන් සෝදන නමුත් නිර්මල බුද්ධිය කිලිටි බවට පැමිණේ. යෞවන ගර්වයෙන් යුක්තවූවන්ගේ දෘෂ්ටිය හෙවත් දැක්ම නොහරණ ලද සුදුපැහැති රජස් සහිත වූවක් වේ. තරුණ කාලයෙහි සියකැමැත්තෙන්ම පියවි ස්වභාවය මිනිසා බෙහෝ දුරට පහකරයි. දූවිලි සහිතව උඩට නැඟුණු සුළං ගුළියක් වියළි පත්‍ර ඉවත් කරන්නාක් මෙනි. ඉතා නපුරු අවසානයක් ඇති මෙම අභ්‍යන්තර වස්තු පරිභෝග තෘෂ්ණාව නමැති මුවදෙන නිරන්තරයෙන් ඉන්ද්‍රිය නැමති මෘගයන් ගෙන යන්නීය. එබැවින් පසක්මසුව නොවිඳි ඔබට මෙය ගුරූපදේශ ලබා ගැනීමට කාලයයි. අනංගයාගේ හී පහරින් සිදුරු වූ හදවතක් ඇති කල්හි ගුරූපදේශ ජලයක් මෙන් ගලායයි. අයහපත් ගති පැවතුම් ඇත්තවුන්ට කුලය හෝ ශාස්ත්‍රය හෝ උගත්කම හෝ හික්මීමට කාරණා නොවේ. සඳුන් දරවලින් උපදින ගින්න කුමක් නම් නො දවාද?. ගිනි නිවීමට හේතුවන ජලයෙන් ඇතිවන වඩබාග්නිය අතිශයින් චණ්ඩ නොවේද?. එහෙයින් ඔබ ඉතා දැඩි ලෙස අනුශාසනා කළ යුත්තතෙක් වූයෙහි ය."*[23]

ඉහත ඡේදයේ දැක්වෙන්නේ තුරුණු වියේ සිටි කුලදරුවෙකුට බෞද්ධ භික්ෂුවක් විසින් කරන ලද අනුශාසනයකි. පෙරදිග සංස්කෘතිය තුළ ඇතැම් බටහිර රටවල මෙන් වයස සපිරුණු කල අනාරක්ෂිත ලෙස දරුවන් සමාජගත කරන්නේ නැත. මිනිස් සන්තානයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයන් පෙරදිග සංස්කෘතියෙහි පවතී. ශ්‍රී ලාංකික සංස්කෘතියත් අධ්‍යාපනයත් ගොඩනැගී ඇත්තේ ආරාමික සංස්කෘතියට සමගාමීවය. සිරිසඟබෝ කුමරුන්ට නන්ද හිමියන් විසින් පෙන්වා දෙනු ලබන්නේ එකී ආරාමික සංස්කෘතිය හා ප්‍රතිබද්ධ සංස්කෘතික ජීවන රටාවයි. තරුණ විය ඉබාගතේ යා හැකි චර්යාපද්ධතියකට නැඹුරුවක් දැක්විය හැකි හෙයින් සවිඥඥානික

තාරුණ්‍යයක දිශානතිය පෙන්වාදීම මෙරට මව්පියන් වැඩිහිටියන් හා භික්ෂූන්ගේ කාර්යභාරයක්ව ද පැවැති බව මෙයින් අනාවරණය වේ. කාලභේද ව්‍යතික්‍රමණයෙන් තරුණයෙකුට ගුරුපදේශ අවශ්‍ය බව බෞද්ධ සමාජය පිළිගනී. මෙකල ඒ වෙනුවට විශේෂඥ උපදෙස් හෝ වැඩිහිටියන්ගේ මාර්ගෝපදේශකත්වයන් අදහස් වේ. තරුණ විය පර්වතයකින් ගලා එන ගංගා ජලයක් මෙන් සැඩ පරුෂය. වේගවත්ය. (ගිරිනදී වෙගොපමං යෞවනම්) එබැවින් එයට නිසිපරිදි ගළා යාමට මාවතක් තිබිය යුතුය. නන්ද හිමියන් සංඝබෝධි කුමරුන් ප්‍රබුද්ධ යෞවනයෙකු කොට නිරන්තරයෙන් ගුරුපදේශ ලබා ගත යුතු බව පවසන්නේ යොවුන් වියේ දී ඉන්ද්‍රිය වශගවීමෙන් තරුණයෙකුගේ පරිහානිය ශීඝ්‍රයෙන්ම සිදුවිය හැකි හෙයිනි. බුද්ධිය කුලය උගත්කම් තනතුරු ආදිය පසෙක ලා අනාචාරයේ යෙදෙන අය පිළිබඳ අපි කොතෙකුත් අසා ඇත්තෙමු. තරුණයන් සඳහා ආගමක් අවශ්‍ය වන්නේ ඔවුන්ට වෘත්තීය පහසුකම් සැපයීමට නොව එකී විනාශකාරී ගමන්මග ආවරණය කිරීම සඳහාය.

බෞද්ධ තරුණයෙකු පන්සල් යා යුත්තේත් වරින්වර බණදහම් ඇසිය යුත්තේත් භාවනාව වැනි මානසික අභ්‍යාසයන් වැඩිය යුත්තේත් ඔහුගේ හෝ ඇයගේ මානසික ආතතියන් සමනය කිරීම හෝ ආවේග පාලනය කිරීම හෝ මානසික සමබරතාව සුරක්ෂිත කරගැනීම සඳහාය. වර්තමානයේ වාණිජකරණය වූ සමාජ රටාවක් තුළ ආගමික අනුශාසනා ලබාගැනීමෙන් තරුණ ප්‍රජාව බෙහෙවින් ඈත්වීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍යමය අරමුණු සහිතව සිදුවන මනෝ උපදේශන ක්‍රම සමාජගත වී තිබේ. මෙය පෙරදිග රටවල් බටහිරීකරණය වීමේ ප්‍රතිඵලයකි. බටහිර සියල්ල ප්‍රතික්ෂේප කළයුතුය යන්නක් මෙයින් අදහස් නොවේ. අවිචාරවත් ලෙස නිසරු බටහිර ගති ලක්ෂණත් පෙරදිග සාරධර්මත් අතර අසරණ වන යෞවනයන් වළඳටත් පොළොවටත් නො පෑහෙන වළං කැබැල්ලක් මෙන් අවලංගු පුද්ගලයෝ බවට පත් වෙති.
සාම්ප්‍රදායික හා පාරම්පරික ගති සිරිත්වලට නතු වී සිටීම ඇතැම්හු උසස් කොට සලකන අතර ඇතැම්හු කුල සිරිත් ආදිය ව්‍යතික්‍රමනය කරමින් සීමා මායිම් රහිතව ක්‍රියාකිරීම තාරුණ්‍යයේ යුක්තිය හා නියමය කොට සලකති. මව්පියන්ට නතු නොවී රැඩිකල් තීරණ යොවුන් තරුණයන් විසින් ගනු ලැබීම අප ජීවත්වන සමාජයේ සුලබ දසුනකි. නමුත් බොහෝ තීරණ වැරදි සහිතය. ඒවා හුදු දේශපාලනයට සංස්කෘතියට මත්ද්‍රව්‍යවලට අබ්බැහිවීම ලිංගික අපරාධ වැනි දේවල් හා සම්බන්ධ වූ ඒවාය. ඉතා නිවැරදි ලෙස මනෝවිද්‍යාඥයෝ තරුණ විය ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යයක් (Turning Point) ලෙස පවසන්නේ මේ නිසාය. සැබැවින්ම ස්වාධීන ස්වතන්ත්‍ර හා රැඩිකල් තීන්දු තීරණවලට එළඹීම වරදක් නොවේ. තරුණ සිදුහත් විසින් මව්පිය රුචිකත්වයට අවනත නොවී ඔවුන් කඳුළු සළමින් හඬද්දී බිරිඳ දරුවා මව්පියන් ඥාතීන් අතහැර අධ්‍යාත්මික ඥානය සොයා යාමේ රැඩිකල් තීරණයක් ගනු ලැබිණ.[24] එම තීරණය නිසා ඔහු අනේකවිධ සත්ව වර්ගයාගේ දුක් කඳුලු සතුටු කඳුළු බවට පත් කළේය. ධර්මය උගත්කම බුද්ධිමත්බව ජානමය ගති ලක්ෂණ විශේෂ

උපදේශ ආදිය නිසා වර්තමානයේ ද අභියෝග බාරගනිමින් සාර්ථකත්වය සොයා ගිය සහ සොයා යමින් පවතින තරුණ තරුණියේ අපි දකිමු. මානව වර්ගයාගේ සුවපහසුව සඳහා ඔවුන් ජාතියට බොහෝ දේ ප්‍රදානය කරනු අයුරු දෛනික මාධ්‍ය සහ අන්තර්ජාලය විසින් නිරන්තරයෙන් අපි දැනුවත් කරනු ලබමු.

තරුණයෝ වූකලී රටක ජාතියක අනාගතය නිර්මාණය කරන්නෝය. ඔවහු ආගමික නායකයෝය. ගුරුවරුය. ඉංජිනේරුවරුය. වෛද්‍යවරුය. කලාකරුවෝය. ගවේෂකයෝය. ව්‍යාපාරිකයෝය. පරිසරවේදීහුය. සැලසුම් හා ඉදිකිරීම්කරුවෝය. වෘත්තිකයෝය. මෙසේ ශ්‍රමික හා බුද්ධිමය දායකත්වය විසින් විවිධ පුද්ගලයන් ලෙස ක්‍රියාකරන උත්තුංග හා ජවසම්පන්න තරුණ විය තුළ ඒ ඒ පුදගලයාට සමාජයේ දියුණුවට හෝ පරිහානියට කළ හැකි බලපෑම අනල්පය. සමාජ සංස්කෘතික අධ්‍යයනයන්හි විනිවිද පෙනෙන කරුණක් වන්නේ ඉතා ආචාරශීලී ලෙස වැඩුණු තරුණයන් සමාජයේ සැබෑ වෙනස්කම් සිදුකරන බවයි. සිද්ධාර්ථ ගෞතම බෝධිසත්ත්ව චරිතය මෙයට කදිම නිදසුනකි. සංයමයෙන් වඩන ලද බුද්ධිමය භාවිකත්වයක් නැති තරුණ ප්‍රජාව සමාජ පිළිලයන් වන අකාරය බෞද්ධ සාහිත්‍යය තුළ දේවදත්ත පෝරිසාද වැනි චරිතවලින් නිරූපණය වේ. මේ නිසා තරුණ විය ගොඩ නැගිය යුතු ආකාරය පිළිබඳ බෞද්ධ දැක්ම තේරුම් ගැනීම සිද්ධාර්ථ ගෞතම චරිතයට වඩා උසස් ජීවන ප්‍රතිපදාවක් අපට හමු නොවේ.

බුදුදහම වූකලී සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ විසින් යොවුන් වියෙහි කරන ලද පර්යේෂණාත්මක ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.[25] බුදුසසුනේ ව්‍යාප්තිය වූකලී හුදෙක් භද්‍ර යෞවනයේ විසූ කුලදරුවන්ගේ අප්‍රතිහත කැපවීමක ප්‍රතිඵලයක් වශයෙන් සිදුවූවකි. යසකුල පුත්‍රයා සහ ඔහුගේ යහළුවන් පණස් දෙනෙකු මුලින්ම බුදුසසුනට අතුළු වූහ. එසේම මුල් අවධියේ දී සසුන්ගත වූ **උපතිස්ස කෝලිත** වැන්නන් **ඛේමා උප්පලවණ්ණා** වැන්නියන් තරුණු වියෙහිම වූවන් බව සිතීමට බොහෝ සාධක ලැබේ. එයින් තහවුරු වන්නේ ලෞකික හෝ අලෞකික වශයෙන් ඵලදායක යමක් කිරීමට සුදුසුම කාලය තරුණ විය බවයි.

## නූතන ලෝකය හා තරුණ දායකත්වය

වර්තමායේ අපි නව සහස්‍රයක එළිපත්තෙහි ජීවත් වන්නෝ වෙමු. ලෝකය මිනිසුන්ට සිතුමතේ ජීවත්වීමේ පාරාදීසයක් වී ඇත. භෞතික සම්පත් විසින් ලෝකය ඉමහත් දියුණුවක් ලබා ඇති අතර අසංඛ්‍ය ජනතාවක් දුප්පත්කමින් පෙළෙමින් අවශ්‍යතා හා ප්‍රාර්ථනා රාශියක් පොදිබැඳ ගනිමින් සිටී. වෛද්‍යවිද්‍යාවේ සහ තාක්ෂණයේ විස්මයාවහ දියුණුවක් ලබා ඇති ලෝකයේ නොගිණිය හැකි තරම් ජනතාවක් විවිධ හා සුව නොකළහැකි රෝගවලින් දෛනිකව මියයමින්

සිටිති. දිනපතා ඩොලර් මිලියන ගණන් වියදම් කොට මාරක අවිච ආයුධ නිෂ්පාදනය හා ආනයනය කරන අතර මන්දපෝෂණයෙන් හා කුසින්නෙන් පීඩිතව වාර්ෂිකව මිලියන් ගණන් දරුවෝ ශෝචනීය ලෙස මියයති. සන්නිවේදන තාක්ෂණය එක් තත්පරයිකින් ලොව පුරා පැතිර යන නමුත් තවමත් ලොව අවසාක්ෂරතාවෙන් යුතු දරුවෝ මිලියන ගණන් වෙසෙති.

ආගමික පරිසරය තුළ ද සුවිසාල පන්සල් පල්ලි කෝවිල් හා වෙනත් ආගමික ස්ථාන සමඟම යෝධ හා විසිතුරු පිළිම කුරුස සුරුවම් ආදිය ඉදිවුවත් ගුණාත්මක වශයෙන් ඉමහත් පරිහානියක් ද මිනිස් සමාජය තුළ සිදුවෙමින් පවති. සෑම ක්ෂෙත්‍රයකම පිටතින් ශෝභමාන පෙනෙන ඇතුළතින් විසකුරු හා බියකරු යථාර්ථයක් ගැබ් වී ඇත. ජනගහණ වර්ධනය ශීඝ්‍ර වෙමින් පවතින අතර ඇතැම්හු ලෝකය අත්පත් කර ගැනීමේ මායාවෙන් මුසපත් වී ක්‍රියා කරති. අසීමිත ජනගහණය හා අසීමිත ආශාවන් නිසා සීමිත ඉන්ධන ජලය ආහාර යනාදි අවශ්‍යතා වේගයෙන් ක්ෂය වෙමින් පවතින හෙයින් මිනිසා තමන් ජීවත්වන ලෝකය ඉක්මවා වෙනත් ග්‍රහලෝක සොයා පරීක්ෂණ කරති. මෙසේ ලෝකය දෛනිකව භෞතික වශයෙන් දියුණුවට යන නමුත් එලෙසින්ම වැඩෙන විසඳුමක් නොමැති වේදනාකාරී හා සුව නොවන තුවාලයකින් ද පෙළෙමින් සිටී. එහෙයින් ලෝකයා මෙයින් මුදවා ගැනීමේ කර්තව්‍යයක් අප ඉදිරියේ ඇත. දේශපාලනික ආර්ථික නෛතික ආගමික ආදි සෑම ස්තරයකටම පැවරෙන මෙම වගකීමට විසඳුමක් ලබාදීම සඳහා බුදුදහම වඩාත් ප්‍රායෝගික හා යථාර්ථවාදී ඉගැන්වීම් ඉදිරිපත් කෙරෙන අතර එයින් මූලික වන්නේ මිනිස් සමාජයට මනුෂ්‍යත්වය හඳුන්වා දීමයි. ලෝකයේ තරුණ තරුණියන් තුළ මෙම අවබෝධය තහවුරු කිරීම එයිනුදු ප්‍රමුඛ කාර්යයක් වේ. කුමක් නිසාද යත් මනුෂ්‍යත්වයේ සීමාවන් උල්ලංඝනය කිරීමේ ප්‍රබල හැඟීම් සක්‍රිය වන්නේ ඔවුන්ගේ ජීවරුධිරයේ ප්‍රබලකම නිසා බැවිනි.

යෞවන අවධිය ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස මනෝවිද්‍යාඥයෝ පෙන්වා දෙති. මෙම අවධියේ වෙසෙන්නෝ සම්ප්‍රදාය වේගයෙන් ගොඩනඟන අතර වනසති. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම ගණිකා වෘත්තිය ඒඩ්ස් විරැකියාව නූගත්කම පුරාවස්තු මංකොල්ලකෑම් සොරකම් බියවැද්දීම් අපරාධ හා වධහිංසා පළිගැනීම් ත්‍රස්තවාදය දේශපාලන ප්‍රචණ්ඩකාරීත්වය වැනි බොහෝ සමාජ දේශපාලනික අර්බුද සමාජගත වන්නේ ප්‍රබල වශයෙන්ම තරුණ කාලයේය. අප ජීවත්වන සමාජයේ බොහෝ යහපත් හා අයහපත් සිදුවීම් දෙස නිරීක්ෂණය කර බලන්න. එවිට ඔබට මෙම යථාර්ථය තේරුම්ගත හැකිය. වෘත්තීය අරගල ශිෂ්‍ය උද්ඝෝෂණ සාහසික මංකොල්ලකෑම් ලිංගික චෝදනා ආදිය බහුලව පවතින්නේ තරුණ සමාජයේය. එහෙත් ඔවුහු අපගේ පුත්‍රයෝ සහ දියණියෝය. යහපත් ආගමික හැදියාවක් හා අධ්‍යාපනයක් ඇති තරුණයෝ

මේ පිළිබඳ අවධානයෙන් සමාජයේ ප්‍රගමණයට ක්‍රියාකරන අතර ගුණාත්මක පසුබිමක් නොමැති අඩු අධ්‍යාපනයෙන් යුතු තරුණ තරුණියේ සමාජ අර්බුද නිර්මාණ කරති.

තරුණ විය මානව වර්ගයාගේ පදනම වූබව මෙට වර්ෂ දෙදහස් පන්සීයකට පෙර ගෞතම බුදුන් වහන්සේ පෙන්වා දුන්හ. වර්තමානයේ ද බොහෝ අය තරුණයෝ ජාතිය දරා සිටින ස්තම්භ ලෙස හඳුන්වනු ඔබ අසා ඇත. එලෙසින්ම බුදුදහම දරා සිටීමේ ස්තම්භයෝ වන්නාහු ද තරුණ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවෝම වන්නාහුමය. මෙකී කරුණු යටතේ රටක තරුණ ප්‍රජාවගේ ගැටලු විෂයෙහි රාජ්‍යයක ප්‍රමුඛ අවධානය යොමුවිය යුතුය. රාජ්‍යයක් විසින් ඉටුකළ යුතු කාර්යභාරයට අමතරව මෙම ගැටලු විසඳීමට අවශ්‍ය වන තවත් ප්‍රමුඛ කාරණයක් වේ. එය නම් සමස්ත මානව වර්ගයාගේ පැවැත්මේ පදනම වන තරුණ ප්‍රජාව කායික මානසික ආධ්‍යාපනික ආධ්‍යාත්මික වශයෙන් මානව හිතවාදිත්වය උදෙසා වූ යහපත් නිවැරදි ශක්තිමත්භාවයක පිහිටුවීමයි.

## සිදුහත් චරිතය හා තාරුණ්‍යය

බුද්ධිමත් තරුණයෙකුට තම පෞරුෂේය තාරුණ්‍යය අර්ථවත් ලෙස ගොඩනගා ගැනීමට සිද්ධාර්ථ ගෞතම චරිතයෙන් ලැබිය හැකි ආදර්ශය අතිප්‍රබල වේ. මූලාශ්‍රයානුකූලව සිදුහත් කුමරු විශ්වාස කළ නොහැකි තරම් සුඛෝපභොගී ජීවිතයක් ගතකළ කෙනෙකි. සුරූපී තරුණියන් විසින් විසින් පිරිවරන ලදුව නිරතුරු සෞන්දර්යාස්වාදය ලද තුන් ඍතුවට සුදුසු මන්දිරවල කල් ගෙවූ රාජකීය ඇඳුම් පැලඳුම් හා අබරණින් ගත සරසාගත් යෞවනයෙකු ලෙස සිදුහත් චරිතය ඓතිහාසික ලේඛනවල සටහන් වේ.[26] මෙම තරුණයා තරුණ විය සම්බන්ධයෙන් කල්පනා කළේ ඔබ ඒ පිළිබඳව සිතන ආකාරයෙන් ම ද? මව්පිය උරුමයෙන් හෝ වැඩිහිටියන්ගේ ප්‍රදානයන් වශයෙන් ලද භෞතික සම්පත් අලුයම හෙලූ කෙළ පිඩක් සේ සිදුහත් කුමරු විසින් සැලකුයේ ඔවුන් කෙරෙහි ද්වේෂයකින් නොව එම සම්පත් අංගවිකලයෙකු මෙන් භුක්ති විඳීම තම යොවුන් වියට යෝග්‍ය ක්‍රියාවක් ලෙස ඔහු උපකල්පනය නොකළ බැවිනි. භෞතික සම්පත් ආශ්‍රයෙන් ලැබෙන සමාජ විඥානයට වඩා මහල්ලෙකු ලෙඩෙකු මළමිනියක් සහ පැවිද්දෙකු පිළිබඳව සිතීමෙන් හා දැකීමෙන් ලැබෙන යථාර්ථඥානය උසස් බැව් සිතීමට තරම් සිදුහත් කුමරුගේ බුද්ධියේ නිම්වළලු ප්‍රසාරණය වී තිබිණි.[27] වර්තමාන ලෝකයේ බොහෝ තරුණයන් සම්පත් නැතිකම මානසික පීඩනයක් කරගනිමින් සියදිවි නසා ගැනීමට හෝ නොකෙුත් සාපරාධී ක්‍රියවලට යොමුවීමට සිතති. ඒ තාරුණ්‍යයේ ජවය ඔවුන් හඳුනාගෙන නැති නිසාය. සිදුහත් කුමරු යොවුන් ජවය හා බුද්ධිමය ප්‍රභූත්වය පිළිබඳ විශ්වාසය තබමින් රජමැඳුර අතහරී. යසෝදරාව හා රාහුල කුමරු අතහරී. ගල්ගුහා වනපෙත් සුසාන ආදියේ දිවිගෙවයි. බොහෝවිට නිරාහාරව සිටී. මනුෂ්‍ය අමනුෂ්‍ය හිරිහැර උපද්‍රව අත්විඳී. නින්දා ගැරහුම් අකම්පායව පිළිගනී. මාරාන්තික අභියෝගවලට

මුහුණ දී අවසානයේ තුරුණු වියෙහි දී ම බුද්ධත්වය සාක්‍ෂාත් කරලීමෙන් අභියෝගවලට මුහුණ දීමෙන් තරුණයෙකු වශයෙන් කළහැකි දේ ක්‍රියාවෙන් ලෝකයට තහවුරු කරයි.

බුද්ධත්වයට පත්වුණු තරුණ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ තත්කාලීන භාරතීය ආගමික ක්ෂේත්‍රයෙහි විස්මයාවහ කාර්ය සාධකයෙක් වූහ. තරුණයෙකු තුළ ඇතිවන ආත්ම මායාවෙන් මිදී සිටීමේ බුද්ධිමය පන්නරය උන්වහන්සේගේ ජීවිතය තුළ විය. සතර පෙරනිමිති දැකීමෙන් ලද චින්තන ප්‍රබෝධය අසත්‍යයෙන් සත්‍යය කරා යාමට තරම් ප්‍රබලවිය. එකල සිදුහත් දුටුවේ සතර පෙර නිමිති පමණකි. වර්තමාන තරුණයෝ මෙබඳු දේවල් කොපමණ දකිත් ද? ඔවුහු නිබඳ මහල්ලන් පමණක් නොව බාලවියේ සිටිද්දීම මහල්ලන් සේ ජීවත්වන්නන් ද තරුණ වියේ සිටිද්දීම මහල්ලන් සේ වෙසෙන්නන් ද පිළිකා, ඇදුම, වකුගඩු අක්මාදි අවයව ආබාධිතයන් ද, ඒඩ්ස් වැනි රෝගවලින් පෙළෙනනන් ද, මළවන් මෙන්ම මරාදමන ලද්දන් ද, අත්පා කපා දැමූ අය ද සිරකරුවන් රෝහල්වල වෙසෙන්නන් ආදි අනේකවිධ දුර්දශාපන්න පුද්ගලයන් ඔවුහු දකිති. කිම? ඔවුහු සිදුහත් කුමරු මෙන් යථාර්ථය සෙවීමෙහි උත්තේජන ලැබුවාහු ද? නැත. කුමක් නිසාද යත් සාංසාරිකව පුරුදු පුහුණු කිරීමෙන් භාවිත මනසක් හා මුහුකුරා ගිය බුද්ධියක් නොමැති හෙයිනි. මෙබඳු දේ ගැන සිතීම අශුභවාදී ලක්ෂණයක් ලෙස ඇතැම් තරුණයෝ සිතති. එසේ සිතීම ඔවුන්ගේ උසස් ලක්ෂණයක් නොව දීන නිහීන චින්තනයේ ඵලයකි. සැබැවින්ම අඳුරෙන් එළියට යාම සඳහා ලෝකයේ ද්වන්දාත්මක සිදුවීම් දෙස යථාර්ථවාදීව බැලීම තරුණයෙකුට අවශ්‍යවේ. එබඳු චින්තන ස්වභාවයක් සහිත තරුණයෙකු අබියසට පැමිණෙන මානසික සම්බාධක විෂයෙහි සාර්ථක විසඳුම් දීමට ඔහුට හැකියාවක් ඇත. නිදසුනක් ලෙස ඇතැම්විට කෙනෙකුට ඵලදායක යමක් කිරීමේ දී යම් යම් දෘඪ බැඳීම් අතහැරීමට සිදුවේ. විදේශගත වන කෙනෙකුට මව්පිය, දූදරු, බිරිය, ඥාතීන් ආදීන්ගෙන් වියුක්තව විසීමට සිදුවේ. වකුගඩු, අක්මා රෝගාදියෙන් බේරී සිටීමට, මත්පැන් දුම්පානය ආදියෙන් වැළකී සිටීමට සිදුවේ. කුඩා කල සිට වැඩූ එකී බැඳීම් හා පුරුදු තරුණ කාලයේ දී අත්හැරීම ඔහුට මානසික බාධකයක් වේ. එබැවින් තරුණ ප්‍රජාව ඵලය දෙස බලා එබඳු මානසික බාධකවලින් (Mental barriers) උත්තරණය වී නිවැරදි මඟට (Right Paths) එළඹිය යුතුය.

## අධ්‍යාපනය

තරුණ තරුණියන් අධ්‍යාපනය විෂයෙහි සුවිශේෂී අවධානයක් සහ කැපවීමක් කළයුතුය. විශ්වවිද්‍යාල ශිෂ්‍යයා විප්ලවවාදී විය යුතුය යනුවෙන් පැවසූ ඇතැම් උගතුන් පිළිබඳව අපි අසා ඇත්තෙමු. එහෙත් මෙකී විප්ලවාදිත්වය යනු දඬුමුගුරු මෝරා එකිනෙකා මරාගනිමින් කෙරෙන විප්ලවයක් නම් එය සැබැවින්ම සමාජවිරෝධී ප්‍රකාශයකි. සිදුහත් කුමරු තරුණ වියෙහි දී ඉගෙනීම විෂයෙහි දැඩි කැප කිරීමක් කළේය. ගුරුන් හමුවෙහි ඔහු කඩුශිල්ප, දුනුශිල්ප ආදි අෂ්ටාරස කලාවන් හදාළේය. එහි ලා පාරප්‍රාප්ත විය. ඒ අතරම අධ්‍යාත්ම විද්‍යාව ද ප්‍රගුණ කළේය.

අළාරකාලාම වැන්නන්ගේ දැනුම තොල ගෑ පමණින් ආත්මගත කළේය. මෙම අෂ්ටාරස කලාවන්ට නූතන ව්‍යවහාරයේ පවතින ගණිතය, මිනින්දෝරු ශිල්පය, කාව්‍යශාස්ත්‍රය, සංගීතය, ජ්‍යොතිෂය, ආයුර්වේදය, දුනුශිල්ප, කඩුශිල්ප ආදිය අයත් වේ. අන්තර්ජාලය ඔස්සේ දැනුම සොයා යමින් වල්මත් වන දරුවන් ගැන විලාප නගන දෙමාපියන් වෙසෙන ලෝකයක සිදුහත් කුමරුන් ලබාගත් විවිධ ක්ෂෙත්‍රයන් පිළිබඳ දැනුම අපට උගන්වන දෙය අමුතුවෙන් විස්තර කළයුතු නොවේ. අධ්‍යාපනය සම්බන්ධයෙන් වැදගත්ම දේ වන්නේ එකී අධ්‍යාපනය බුද්ධිය මෙන්ම මනුෂ්‍ය අධ්‍යාත්මය ද සමබරව පෝෂණය කළ බවයි. බොහෝ අය විශ්වාස කරනුයේ අධ්‍යාත්මික විද්‍යාවන්ට වඩා ලෞකික විද්‍යාවන් ඵලදායී බවයි. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් පවා අවධාරණය කරනුයේත් තරුණයන් පොලඹවනු ලබනුයේත් එබඳු ඵලදායක භෞතික විද්‍යාවන් හැදෑරීම සඳහාය. ප්‍රයෝගික ලෝකයේ මූල්‍යමය ගණුදෙනු සඳහා එම ශාස්ත්‍රයන් හැදෑරීමෙහි වරදක් නැත. සිද්ධාර්ථ ගෞතමයන් පවා තුරුණු වියෙහි දී යුදශිල්ප කඩුශිල්ප ආදිය හදාළේ එබැවිනි. එහෙත් සියල්ලට වඩා අධ්‍යාත්මික විද්‍යාවන් වැදගත් යැයි ආගම ධර්මය විසින් උගනවනුයේ එකී භෞතික විද්‍යාවන් මගින් සොයන වින්දනය ඛේදාන්තයක් බැවින් එය අර්ථවත් කිරීම පිණිසය. නිදසුනක් ලෙස ඔබ ඉංජිනේරුශිල්පය උගත් කෙනෙකු යැයි උපකල්පනය කරන්න. ඔබගේ ජීවිත කාලය ගෙවීම සිදුවන්නේ ගෙවල් දොරවල් මාර්ග ආදියේ දිග පළල මැනීමෙන් සිමෙන්ති වැලි තීත්ත ආදිය සමග නොවෙද? ව්‍යාපාරිකයෙකු නම් විවිධ භාණ්ඩ ගැනීමෙන් දීමෙනි. අනෙකුත් වෘත්තීන් ද එසේමය. ආගමික අධ්‍යාපනය හෝ භාවනාව හෝ සිදු කරන්නේ මානසික අභ්‍යාසයකි. ලොව කිසිදු කෙනෙකුට කායික ක්‍රියාකාරකම්වලින් පමණක් මානසික සන්තෘප්තියක් ලැබිය නොහැකිය. එබැවින් ඔහු බුද්ධියට ලැබෙන දැනුම් සම්භාරයන් ලෞකික විෂයන් හැදෑරීමෙන් අත්පත් කරගතයුතු අතර අපගේ සංවේදනාත්මක අංශය තියුණු බවට පත් කරවන ආගම ධර්මය ආශ්‍රයෙන් ලබන ආධ්‍යාත්මක ඥාන සම්භාරයන් ද ප්‍රගුණ කළ යුතුය. ආගමික සන්දර්භය තුළ දී භික්ෂුවක් වශයෙන් ත්‍රිපිටක ධර්මය හැදෑරීම, භාවනා කිරීම වැනි දේ පසෙක තබා දේශපාලනවිද්‍යාව ආර්ථික විද්‍යාව ගණකාධිකරණය වැනි ලෞකික විෂයයන් හැදෑරීමට වෙහෙසීම ආලෝකයේ සිට අඳුර සෙවීමක් වැනි නිසරු ක්‍රියාවකි. තරුණයෙකු තුළ අප කියන මෙම අධ්‍යාපනය තහවුරු වීම සඳහා ස්වකීය ආත්මගත උත්තේජනය අවදිවිය යුතුය. තරුණ වියට භාවනාව වැනි මානසික අභ්‍යාසයන් වටිනා ප්‍රතිලාභ ලෙස ආගමික සංස්ථා විසින් අවධාරණය කෙරෙනුයේ ඔවුන් තුළ සැඟවී ඇති ශක්තීන් අවදි කිරීම සඳහාත් පසුගාමී නොවී අභිගාමී වීම සඳහාත් අවබෝධ නොවූ දේ අවබෝධ කිරීම සඳහාත් තහවුරු වූ දැනුම ස්ථාපිත කිරීම සඳහාත් තරුණයෙකු ලබන ආධ්‍යාත්මික විද්‍යාව අවශ්‍ය වේ.

## තාරුණ විය සහ කුටුම්බ සංරක්ෂණය

අවිවාහක ගිහි ජීවිතය පෙරදිග රටවල වැදගත් කොට නොසලකයි. ගිහියෙකු නම් විවාහවිය යුතුය, නොඑසේනම් පැවිදිවිය යුතුය යන්න පිළිගත් අදහසකි. බෞද්ධ සාහිත්‍යයේ තරුණ වියේ දී විවාහවීමත් සාර්ථක පවුල් ජීවිතයක් ගෙවීමත් සඳහා සැපයෙන උපදේශ රාශියක් වේ. තරුණයෙකු හෝ තරුණියක විසින් කළයුතු වැදගත්ම කරුණ වන්නේ තමාට සුදුසු ප්‍රතිවිරුද්ධ ලිංගික සහකරුවා සොයා ගැනීමයි. සමසීල, සමසද්ධා, සමපඤ්ඤා යනාදි ගුණාංගවලින් හෙබි තැනැත්තා හෝ තැනැත්තිය තොරා ගැනීමයි. එම ගැළපීම නැති කෙනෙකු තෝරා ගන්නා අය විවාහ ජීවිතයේ අනේකවිධ ගැටලුවලට මුහුණ දීමට සූදානම් විය යුතුය. මහෞෂධ කුමරු අමරා දේවිය විවාහ කර ගැනීමට පෙර කරන ලද පරීක්ෂණය සිහිපත් කර ගැනීම ප්‍රයෝජනවත්ය. බුදුන් වහන්සේ වදාළේ දෙවියෙක් දෙවඟනක් සමග වසන්නාක් මෙන් මෙකී සුසංයෝගය විය යුතු බවයි.[28] රූපය හෝ ධනය පමණක් සලකා විවාහ වීම සදාචාරමය ගැටලු රාශියක් ඇතිවීමට හේතුවේ. මොනරා කෙතරම් ලස්සණ කෙනෙකු වුවත් ඔහු පිරිස් ඉදිරියේ රංගනයේ යෙදෙනුයේ අධොමුඛය කාහටත් පෙනෙන පරිදි පිල් විදහා ගෙනය.[29] අප සමාජයේ වෙසෙන සුරූපී නළු නිළියන් ව්‍යාපාරිකයන් වැනි ප්‍රසිද්ධ තරුණයන් බහුල වශයෙන් බහුභාර්යා සේවනයට යොමු වන්නේත් ඉතා කෙටි කලකින් දික්කසාද වන්නේත් ආචාරමය ශික්ෂණයක් නොමැතිවීම නිසාය. බෞද්ධ ජාතක කථාවල මෙම උපදේශය අපට නිබඳ ලබාදෙයි.

විවාහප්‍රාප්ත තරුණයෙකුගේ කාර්යභාරය වන්නේ කුටුම්බ සංරක්ෂණයයි. මංගල සූත්‍රයෙහි වෛවාහිකයෙකු අනුගමනය කළයුතු වැදග්ම කරුණු කිහිපයක් දක්වයි. 1 මව්පියන්ට සැලකීම (මාතාපිතු උපට්ඨානං) 2. අඹුදරුවන් පෝෂණය කිරීම 3. වැඩ කටයුතු අවුල් නොකරගැනීම (අනාකුලා ච කම්මන්තා) 4. දන්දීම (දානං) 5. දැහැමි ලෙස හැසිරීම (ධම්මචරියං) 6. ඥාතීන් විෂයෙහි වන යුතුකම් ඉටු කිරීම (ඤාතකානඤ්ච සංගහො) 7. නිවැරදි ක්‍රියා කිරීම (අනවජ්ජානි කම්මානි) 8. අකුශලයන්හි මනසින් නො ඇලීම හා වරදින් වෙන්වීම (ආරති විරති) 9. මත්ද්‍රව්‍ය භාවිත නො කිරීම (මජ්ජපානා ච සඤ්ඤමො) 10. නිතර සිහිකල්පනාවෙන් කටයුතු කිරීම (අප්පමාදො ච ධම්මෙසු) 11. ගරුකළ යුත්තන්ට ගරුකිරීම (ගාරවො) 12. යටහත් පහත් පැවැත්ම (නිවාතො) 12. ස්වකීය අඹුදරුවන්ගෙන් සහ ලද දෙයින් සතුටට පත්වීම (සන්තුට්ඨී) 13. වෙනත් අය කුඩු මහත් වශයෙන් තමාට කළ අනුග්‍රහ පිළිබඳ කෘතඥවීම (කතඤ්ඤුතා) 14. ඉඩ ලද අවස්ථාවන්හි ධර්මය ඇසීම (කාලෙන ධම්මසවණං) 15. ඉවසීම (ඛන්ති) 16. අන්‍යයන්ට ඇහුම් කන් දීම (සුවච) 17. ශ්‍රමණයන් දැකීමට යාම (සමණානං ච දස්සනං) 18. ධර්මමය සාකච්ඡා කිරීම (ධම්මසාකච්ඡා) මෙම කරුණු පිළිබඳ අවබෝධයෙන් ක්‍රියාකිරීමේ දී තරුණ අඹු සැමි යුවළකට ගැටලු හා අභියෝග හමුවෙහි ඒවා ජයගනිමින් සාර්ථක පරම්පාරාවක් බිහිකරමින් සුඛිත මුදිත ලෙස දිවි ගෙවිය හැකිය. තරුණ වියෙහි දී වගකීම් මගහරිමින් චතුරාර්ය සත්‍යය පසක් කිරීමෙහි ලා නිරතව සිටීම රටක තරුණ ප්‍රජාවගේ වගකීම නොවන බව මෙයින් පැහැදිලිය.

කායික ශක්තිය තරුණ වියේ සිටින පුද්ගලයෙකුට ලැබී ඇති ලාභයයි. එම ශක්තිය මෙහෙයවා හිතුවක්කාර ලෙස ක්‍රියාකිරීමට වැයම් කිරීම බුද්ධිහීනත්වය ප්‍රකට කරන්නකි. ස්වකීය ශ්‍රමය බාහු බලය කැපවීම මෙහෙයවා ඔවුන් විසින් ස්වකීය වර්ගයා විෂයෙහි දැවැන්ත මෙහෙවරක් කළ යුතුය. කිසි ලෙසකත් ස්වකීය ශක්තිය අනුන් පෙළීම සඳහා නොවිය යුතුය. තම අභිලාෂයන් කෙරෙහි අවදියෙන් සෙසු අයගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා දායකත්වය සැපයිය යුතුය. දිනක් පිඬුපිණිස වඩින බුදුරදුන්ට ස්රපයෙකුට දඬුමුගුරුවලින් හිංසා කරනු ලබන තරුණයන් පිරිසක් හමුවිය. බුදුහු ඔවුන්ගෙන් කුමක් කරත් දැයි විචාළහ. එහිදී ඔවුහු අපි නාගයෙකු මරමුයි කීහ. මෙය ඇසූ බුදුන් වහන්සේ සියලු අය මරණයෙන් තැති ගන්නා බවත් මරණයට බිය බවත් එහෙයින් තමා උපමාවට ගෙන හිංසා කිරීමෙන් ඝාතනය කිරීමෙන් වළකින්නැයි අවවාද කළහ.[30] මෙයින් ඔවුහු ඒ පිළිබඳ දැනුවත් වූහ.

තරඟකාරිත්වය හමුවේ මානව හිතවාදිත්වය භූමදානය කරන ඇතැම් පිරිස් අවි ආයුධ, විෂමිශ්‍ර ආහාර අලෙවිය, භාවිතයට නුසුදුසු බේත් හේත් අලෙවිය, රාජකාරිය කිරීමට පවා අල්ලස් ගැනීම, එකිනෙකා බිඳවා තම අපේක්ෂාවන් සපුරා ගැනීම වැනි අනේකවිධ ක්‍රම මගින් අනුන්ට හිංසා කරති. ඝාතනය කරති. යථෝක්ත භාරතීය ඓතිහාසික සිදුවීම අප තේරුම්ගත යුත්තේ නූතනයේ සිදුවන විවිධ අපචාර අපයෝජන දුරාචාර හා විෂමක්‍රියා මගින් සිදුවන මනුෂ්‍ය හිංසනයට ද අදාළ කරගනිමිනි. එබැවින් තාරුණ්‍යය භුක්ති විඳින ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය තාරුණ්‍යයේ වටිනාකම යුතුකම් හා වගකීම් අවබෝධ කරගනිමින් ක්‍රියා කළ යුතු වන අතර ස්වකීය කායික හා බුද්ධිමය ප්‍රදානයන් ද ලෝකය වෙනුවෙන් යොදමින් සන්තෘප්ත ජීවිතයක් ගෙවීමට බෞද්ධ නිර්දේශයන් අනුගමනය කිරීම ඵලදායක වේ.

---

1. See, *Social and Human Science*, of UNESO website,

2. "*මන්දා බිඩ්ඩා ච වණ්ණා ච - බලා පඤ්ඤා ච හායනා පබ්භාරා ච පවංකා ච - මොමූහා සයනා දස*" **සිංහල විශුද්ධිමාර්ගය**: සිංහලානුවාදය: මාතලේ ශ්‍රී ධර්මවංශ ස්ථවිර, 1957, 517 පිට.

3. **මජ්ඣිමනිකාය** ඔපම්මවග්ග පාසරාසිසුත්ත බලන්න.

4. **සංයුත්තනිකාය** 1. 2. 4.

5. "*ආයස්මතො යසස්ස පඤ්ඤාසමත්තා ගිහීසහායකා ජානපදා පුබ්බානුපුබ්බකානං කුලානං පුත්තා ..........*" **මහාවග්ගපාළි**, යසකුලපුත්තපබ්බජ්ජා බලන්න.

6. "*ඉදානි අනෙන ජටිලසහස්සං පබ්බජිතානං ඉමානි ච අඩ්ඪතෙය්‍යානි පරිබ්බාජකසතානි සඤ්චයානි පබ්බජිතානි ........*" **මහාවග්ගපාළි**, 1.43 පිට බලන්න.

---

7. **දීඝනිකාය**, සොණදණ්ඩ සූත්‍රය බලන්න.

8. Jayasekara, Keerthi, 2012, **From vedic Theology to Buddhist ýychology & other Buddhist Essays**, Quality Printers, Nugegoda, p. 87.

9. **පාලි සිංහල අකාරාදිය**, පොල්වත්තේ බුද්ධදත්තහිමි බලන්න

10. ';*තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො. අකුසලෙන කායකම්මෙන අකුසලෙන වචීකම්මෙන අකුසලෙන මනොකම්මෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො*" අං. නි, 1. 6.

11. *අප්පස්සුතායං පුරිසො බලිවද්දොව ජීරති*
*මංසානි තස්ස වඩ්ඪන්ති - පඤ්ඤා තස්ස න වඩ්ඪති*" **ධම්මපද**, 11. 07

.

12. **විභංගප්පකරණ**, ඛුද්දකවත්‍ථුවිභංග බලන්න.

13. අත්‍ථි භික්ඛවෙ සත්තානං යොබ්බනෙ යොබ්බනමදො, යෙන මදෙන මත්තා කායෙන දුච්චරිතං චරන්ති වාචාය දුච්චරිතං චරන්ති මනසා දුච්චරිතං චරන්ති" අං. නි, පඤ්චකනිපාත, **අභිණ්හ පච්චවෙක්ඛිතබ්බට්ඨානසුත්ත** බලන්න

14. -එම-

15. සරසවි **ඉංග්‍රීසි - සිංහල ශබ්දකෝෂය** බලන්න.

16. "*බෙදො විපත්තීසු පටික්‍රියා න*" **හත්ථවනගල්ලවිහාරවංසය** බලන්න.

17. "*අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං*
*ජිණ්ණකොඤ්චාව ඣායන්ති ඛීණමච්ඡෙව පල්ලලෙ*", **ධම්මපදය** 11. 10.

18. **සංයුත්තනිකාය**, මහාවග්ග, 2. 6 සූත්‍රය බලන්න.

19. "*දහරො ත්වං භික්ඛු පබ්බජිතො සුසු කාළකෙසො, භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො, පඨමෙන වයසා, අනික්කීළිතාවී කාමෙසු. භුඤ්ජ භික්ඛු මානුසකෙ කාමෙ, මා සන්දිට්ඨිකං හිත්වා අකාලිකං අනුධාවි.*" **සංයුත්තනිකාය**, සගාථකවග්ග, සමිද්ධිසුත්ත.

20. **නාගානන්ද** 1. 6 බලන්න.

21. **දීඝනිකාය**, සිගාලකසුත්ත බලන්න.

22. *යෞවනං ධනසම්පත්ති ප්‍රභුත්වමවිවෙකිතා*
*එකෛකමප්‍යනර්ථාය කිමු යත්‍ර චතුෂ්ටයම්* - **හිතොපදේශ** ප්‍රස්තාවිකා බලන්න.

23. **හත්ථවනගල්ලවිහාරවංසයේ** දෙවන පරිච්ඡේදයේ ආරම්භය බලන්න.

24. "*සො ඛො අහං භික්ඛවෙ යෙන දහරොව සමානො සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා මාතාපිතුන්නං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං*" – පාසරාසිසුත්ත, **ම.නි** 1. 3' 6'

25. **මජ්ඣිමනිකාය** ඔපම්මවග්ග පාසරාසිසුත්ත බලන්න.

26. **ජාතකනිදාන** වර්ණනාව බලන්න.

27. "*නිමිත්තෙ චතුරො දිස්වා සිවිකායාභිනික්ඛමි අනූනදසමාසානි පධානං පදහී ජිනො"*, **බුද්ධවංසපාළි**, 18. 17.

28. "*දෙවො දෙවියා සද්ධිං සංවසති*", **සං. නි**, පඨමසංවාසසුත්ත බලන්න.

29. **ජාතකපාළි**යේ නච්චජාතකය බලන්න.

30. "*අත්තානං උපමං කත්වා, නහනෙය්‍ය න ඝාතයෙ*" **ධම්මපදය**, 10 . 2.

**මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි**
**(රාජකීය පණ්ඩිත, B.A (Hon), M.A. (Kel.), Ph.D (Delhi)**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය - කැලණිය